# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2005/48 - 2017 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: 3/6/2012/8(A).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/HW/112 .

පොදුජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් රජයට අත්කරගෙන ඇති බැවින්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

*අත්කරගනු ලබන ඉඩමේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 881 අහුගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අහුගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද අවසාන ගම් පිඹුර අංක 1493 අතිරේක අංක 13 පත්‍ර අංක 13 හා 2016.12.08 දිනැති සිතියමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.3608 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 516 සිට 522 දක්වා වූ බිම් කැබලි (07):

**01.කැබලි අංක 516**

ඉඩමේ නම: වැවේ වත්ත *නොහොත්* කැටකහගහමුලවත්තහේන නුගගහමුල වත්ත;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: එම්. බී. ජේ. එම්. සී. ජයසේකර ; ප්‍රමාණය:හෙක්. 0.4035.

**02.කැබලි අංක 517**

ඉඩමේ නම: වැවේ වත්ත *නොහොත්* කැටකහගහමුල වත්තහේන;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: එම්. බී. ජේ. එම්. සී. ජයසේකර ; ප්‍රමාණය:හෙක්. 0.0293.

**03.කැබලි අංක 518**

ඉඩමේ නම: වැවේ වත්ත *නොහොත්* කැටකහගහමුලවත්තහේන නුගගහමුල වත්ත;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත හා තාවකාලික ගොඩනැගිල්ල; හිමිකම්පාන්නා:රජය; මුල් හිමිකම්පාන්නා: ආර්. එම්. පී. සී. රත්නායක හා බී. ඒ. එස්. මල්ලිකා; ප්‍රමාණය: හෙක්. 0.7468.

**04.කැබලි අංක 519**

ඉඩමේ නම: වැවේ වත්ත *නොහොත්* නුගගහමුල වත්ත හේන;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: ආර්. එම්. පී. සී. රත්නායක හා බී. ඒ. එස්. මල්ලිකා; ප්‍රමාණය: හෙක්. 0.0417.

**05.කැබලි අංක 520**

ඉඩමේ නම: නොදනී; ඉඩම් පරිහරණය: මාර්ගය; හිමිකම්පාන්නා: රජය; මුල්හිමිකම්පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0205.


1A - G 25116 - 17 (2017/02)


මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**06.කැබලි අංක 521**

ඉඩමේ නම: කරව්ගහමුලහේන බුළුගහමුලහේන *නොහොත්* නුගගහමුලවත්ත හේන;ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: ඊ. එම්. ඩී. එන්. එදිරිසිංහ; ප්‍රමාණය: හෙක්. 0.1183.

**07.කැබලි අංක 522**

ඉඩමේ නම: ගොනුමලේ වත්ත *නොහොත්* නුගගහමුලවත්ත හේන ;ඉඩම් පරිහරණය මිශ්‍ර වගාවක් සහිත වත්ත; හිමිකම්පාන්නා: රජය; මුල් හිමිකම්පාන්නා: එස්. ඩබ්. යූ. ඩී. ඩබ්. සිල්වා සහ ඩබ්. ඩබ්. ලීලාවතී; ප්‍රමාණය: හෙක්. 0.0007.

ඉහත ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලුදෙනාම *ගැසට් පත්‍රයේ* නම සඳහන් වී ඇතත් නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමනට ඇති අයිතිවාසිකම් එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වාභාවය එම ඉඩම් කැබලි සඳහා තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු පිළිබඳ විස්තරයක් 2017.02.23 වැනි දින මාගේ කාර්යාලයේ දී මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2017. 03. 03 වැනි දින සිට මා විසින් විධිමත් ලිපියක් මගින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින්ම නැතහොත් තමන් විසින් ලිඛිත බලය පවරන ලද නියෝජිතයෙකු, නියමිත දින,නියමිත වේලාවට අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියකියවිලි සමග ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී හිමිකම් පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් විය යුතුයි.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

සුසන්ත ජයතිලක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
පොල්ගහවෙල.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පොල්ගහවෙල.

02-909

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.